**පළාත් මට්ටමින් පෝෂණ මැදිහත්වීම් සඳහා වූ උතුරු පළාත් ව්‍යාපෘතියේ - 2013**

---

පළාත් මට්ටමින් පෝෂණ මැදිහත්වීම් සඳහා වූ උතුරු පළාත් ව්‍යාපෘතියේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය (ශ්‍රීලංර) සහ ජපන් සමාජ සංවර්ධන අරමුදල අතර 2011 ජනවාරි 31 දින එළඹි අංක ටීඑෆ් 097171 දරන ව්‍යාපෘති ගිවිසුමේ 11 ව්‍යවස්ථාවේ 2.04 (ඇ) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි.

**1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු , අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය**

---

මූල්‍ය ගිවිසුමේ 2.04 වගන්තියේ 2 උපලේඛනයට අනුව , උතුරු පළාත් සභාවේ සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ හා ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ව්‍යාපෘතියේ අරමුණ වනුයේ , ගර්භණී හා කිරිදෙන මවුවරුන් සහ වයස අවුරුදු 5 ට අඩු ළමුන් අතර මන්ද පෝෂණ අනුපාතය අඩු කිරීම මඟින් ශ්‍රී ලංකාවේ උතුරු පළාතේ අවතැන්වූ ජනයාගේ ගෝලීය ආහාර හා මූල්‍ය අර්බුදවල සම්මිශ්‍රණය වූ බලපෑම් අඩුකර ලීමයි. ව්‍යාපෘති අනුමැති ලියවිල්ල අනුව , ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය එජඩො 2,731,700 ක් (ප්‍රදාන ) වන අතර , ජපන් සමාජ සංවර්ධන අරමුදල මඟින් එය මූල්‍යයනය කිරීමට එකඟ වී තිබුණි. 2011 ජනවාරි 31 දින ව්‍යාපෘතිය එහි කටයුතු ආරම්භ කර තිබුණු අතර 2015 ජනවාරි 31 වන විට නිම කිරීමට නියමිතය.

**1.3 ව්‍යාපෘති කාර්යයන්**

---

**1 කොටස :- ක්ෂණික ආහාර සලාක සැපයීම**

---

ව්‍යාපෘතියේ ආරම්භක මාස 6 ක කාල පරිච්ඡේදය තුළ උතුරු පළාතේ ගම්වල අභ්‍යන්තරිකව අවතැන්ව ආපසු පැමිණි ජනයා සහ සත්කාරක පවුල් සමඟ ජීවත් වන අය ඇතුළත් පහත දැක්වෙන කණ්ඩායම් සඳහා ආහාර ශක්තිය හා ප්‍රෝටීන් (බත් සහ ඇට වර්ග ) වර්ධනය කිරීම සඳහා ක්ෂණික ආහාර සලාක සැපයීම.

(i) ඌන පෝෂිත ගර්භණී කාන්තාවන් සහ / හෝ ප්‍රමාණවත් බර ප්‍රමාණයක් නොමැති කාන්තාවන්

(ii) කිරිදෙන මවුවරුන් ( ප්‍රසූතියෙන් පසු මාස 6 ක් දක්වා )

(iii) සත් කාරක පවුල් සමඟ වෙසෙන පීඩාවට පත් වූ ගර්භණී කාන්තාවන් සහ කිරිදෙන මවුවරුන්

(iv) වැඩීම ඇණ හිටි , දුර්වල හෝ ඌන පෝෂිත ලෙස වර්ග කළ අවුරුදු 5 ට අඩු ළමුන් සහ

(v) සත් කාරක පවුල් සමඟ වෙසෙන පීඩාවට පත් ළමුන්

**2 කොටස :-** **ධාරිතා වර්ධනය හා ප්‍රජා සවලීකරණය**

**-----------------------------------------**

ව්‍යාපෘතියේ ආරම්භක මාස 6 ක කාල පරිච්ඡේදය තුළ :-

(i) ළදරුවන්ට හා ළමුන්ට අදාළ ආහාරදීම හා රැකවරණ පුරුදු වර්ධනය කිරීම, ගර්භණී කාන්තාවන්ගේ පෝෂණය සහ ක්ෂුද්‍රපෝෂක අතිරේක ද්‍රව්‍ය ඇතුළත් කර ගැනීම සඳහා මූලික පෝෂණය , පෝෂණ චර්යා වෙනස්වීම සහ ප්‍රජා සවලීකරණයේදී ප්‍රජා ස්වේච්ඡා සේවකයන් , සෞඛ්‍ය සේවකයන් සහ ස්ත්‍රී කණ්ඩායම් වල සාමාජිකයන් බඳවා ගැනීම හා පුහුණු කිරීම.

(ii) බර කිරුම් කණු ( උස හා බර මැනීමේ උපකරණ සහ වර්ධනය අධීක්ෂණය කිරීමේ සටහන් ) සඳහා මූලික උපකරණ සැපයීම සහ හානි වූ බර කිරුම් කණු හා ප්‍රාදේශීය සායනවල කොටස් සඳහා සුළු අළුත් වැඩියා හා නවීකරණයන් සිදුකිරීම.

(iii) සංස්කෘතිකව අදාළ චර්යා වෙනස්වීමේ සන්නිවේදන ද්‍රව්‍ය සංවර්ධනය හා මුද්‍රණය කිරීම සහ

(iv) පෝෂණය වැඩිදියුණු කිරීම සඳහා ප්‍රජා සවලීකරණය.

**3 කොටස :-** **ප්‍රජා මූල පෝෂණ මැදිහත්වීම්**

**-----------------------------------**

එක් එක් දිස්ත්‍රික්කයේ ස්වේච්ඡා සේවකයන් , මහජන සෞඛ්‍ය සේවිකාවන් හා / හෝ ප්‍රාදේශීය සෞඛ්‍ය කාර්ය මණ්ඩලය මඟින් පහත දැක්වෙන දෑ සඳහා ප්‍රතිපාදනය

(i) මන්දපෝෂිත ගර්භණී හා කිරිදෙන මවුවරුන් සඳහා දැඩි චර්යා වෙනස්වීම පිළිබඳ උපදෙස් දීම.

(ii). වර්ධන අධීක්ෂණය සහ මවුවරුන්ට හා අවුරුදු 5 ට අඩු ළමුන්ගේ භාරකරුවන් සඳහා ප්‍රවර්ධනය

(iii). අවදානම් සහිත මවුවරුන්ට සහ ළමුන්ට අතිරේක ආහාර සැපයීම සහ නිවාස පරීක්ෂා කිරීම .

(iv). අදාළ පෝෂණ පුරුදු හා සෞඛ්‍ය වැදගත්කම ප්‍රවර්ධනය සඳහා ගර්භණී කාන්තාවන්ට සහ කුඩා ළමුන්ගේ මවුවරුන්ට චර්යා වෙනස්වීම පිළිබඳ සැසි සංවිධානය කිරීම. මෙම සැසි ස්වාමි පුරුෂයන්ට, නැන්දම්මාවරුන්ට හා යොවුන් ගැහැනු ළමුන්ටද ඉලක්ක වනු ඇත.

**4 කොටස :- ව්‍යාපෘති අධීක්ෂණය , නියාමනය , ඇගයීම හා උපදෙස්දීම**

**------------------------------------------------------------**

(i) පළාත් මට්ටමේ සිට දිස්ත්‍රික් හා ගම් මට්ටම දක්වා සුපරීක්ෂණයන් ඇතුළත්ව ව්‍යාපෘති කළමනාකරණ, සම්බන්ධීකරණ හා අධීක්ෂණ ක්ෂේත්‍ර වලදී ප්‍රතිග්‍රාහකයාට සහායවීම.

(ii) පෝෂණ ආරම්භයන් හා දිගු කාලීන පෝෂණ මැදිහත්වීම් පිළිබඳ අනුගමනය කරන වැඩ සටහන සඳහා සහාය වැඩි කිරීම සඳහා පළාත් සභාව විසින් උපදෙස්දීම හා සම්පත් සචලීකරණයට සහායදීම.

## 1.4 මුල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

**------------------------------------------------------------**

මෙම මුල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම කළමනාකරණයේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මුල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම , ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙන යාමත්, යෝග්‍ය ගිණුම්කරණ ප්‍රතිපත්ති තෝරා ගැනීම සහ යොදා ගැනීමත් , අවස්ථාවෝචිතව සාධාරණ ලෙස ගිණුම්කරණ ඇස්තමේන්තු සකස් කිරීමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 2. විගණන විෂය පථය සහ මතය සඳහා පදනම

------------------------------------------------

මාගේ විගණන පරික්ෂණ මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මෙම වාර්තාවේ ඇතුළත් විගණන මතය , අදහස් දැක්වීම් සහ සොයා ගැනීම් , විගණනය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය සහ පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය , මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් සහ කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළහැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි. මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව විගණනය සිදුකරන ලදී. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන සාක්ෂි නියැදි පදනම මත පරික්ෂා කිරීම් , මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති හා වැදගත් ඇස්තමේන්තු සහ මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. මාගේ උපරිම දැනීම සහ විශ්වාසය පරිදි විගණන කටයුතු සඳහා අවශ්‍ය වන ප්‍රමාණවත් තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලදි. ඒ අනුව මාගේ මතය සඳහා ප්‍රමාණවත් පදනමක් මාගේ විගණනය මගින් සපයන බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීම පිණිස අවශ්‍ය යැයි සලකනු ලැබූ පද්ධති හා පාලන , ගනුදෙනු , වත්කම්, වගකීම් හා ගිණුම් වාර්තා පිළිබඳ එවැනි පරික්ෂා කිරීම්ද එම පරික්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් හා ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතුවලට අදාළ පොත්පත්, වාර්තා ආදියේ විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති හා පාලන ප්‍රමාණවත් වූයේද යන බව,

(ආ) ශ්‍රී ලංකා රජයෙන් සහ ණය සපයනු ලබන නියෝජිතායතනයෙන් ලද අරමුදල්වලින් ව්‍යාපෘතිය වෙනුවෙන් දරන ලද වියදම , මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතුවලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ප්‍රදාන යටතේ මිලදී ගැනීම් හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව,

(ඇ) ප්‍රදාන යටතේ ආපසු ගැනීම් ව්‍යාපෘති ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේද යන බව,

(ඇ) ප්‍රදාන යටතේ සපයන ලද අරමුදල් , ද්‍රව්‍ය හා උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව,

(ඉ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරිම සඳහා යොදා ගන්නා ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදිව හඳුනාගෙන තිබුණේද යන බව,

(ඊ) පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම පදනම් කර ගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව,

(උ) අග්‍රිම අරමුදල් ගිණුමේ ආරම්භක හා අවසාන ශේෂ , එම ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌනපූරණය කිරීම් ව්‍යාපෘතිය විසින් පවත්වා තිබුණු පොත්පත් හා වාර්තා වල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණේද යන බව සහ 2013 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ (ශ්‍රීලංමබැ) ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව,

(ඌ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව, සහ

(එ) ව්‍යාපෘති ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන් වලට අනුකූල වූයේද යන බව,

**3. මතය**

**------**

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව සහ මෙම වාර්තාවේ 5 ඡේදයේ දැක්වෙන කරුණු වලින් උද්ගත වන ගැලපීම්වලින් ඇතිවන බලපෑම් හැර , මාගේ මතය වනුයේ ,

(අ) 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව හා 2013 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඈ) 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය තුළ අග්‍රිම අරමුදල් ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌන පුරණය කිරීම් ව්‍යාපෘතිය විසින් පවත්වා තිබුණු පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණු බව සහ 2013 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණු බව,

(ඇ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බව, සහ

(ඉ) ප්‍රදාන ගිවිසුමේ දක්වා ඇති මුල්‍ය සම්මුතීන්වලට අනුකූල වී ඇති බවත්ය.

**4.** **මුල්‍ය ප්‍රකාශන**

----------------

**4.1** **මුල්‍ය කාර්ය සාධනය**

---------------------

මුල්‍ය ප්‍රකාශන හා විගණනයට ලබාගත හැකි වූ තොරතුරු අනුව , 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘති වියදම රු.150,075,990 ක් විය. සමාලෝචිත කාල පරිච්ඡේදය සඳහා වියදම, ඉකුත් වර්ෂයේ වියදම හා 2013 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම පිළිබඳ සාරාංශයක් පහත දැක්වේ.

| **වියදම් විෂයය** | **දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වියදම** | | **2013 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම** |
|---|---|---|---|
| | **2013** | **2012** | |
| | **රු.** | **රු.** | **රු.** |
| **01 - සංරචකය** | | | |
| **අතිරේක ආහාර සලාක සැපයීම** | 138,322,437 | 95,930,089 | 234,402,526 |
| **02- සංරචකය** | | | |
| **ධාරිතා වර්ධනය හා ප්‍රජා සවලීකරණය** | 5,720,385 | 29,519,128 | 37,765,260 |

| | | | |
|---|---|---|---|
| **<u>03- සංරචකය</u>** | | | |
| **ප්‍රජා මූල පෝෂණ මැදිහත්වීම්** | -- | 14,673,235 | 36,697,964 |
| **<u>04- සංරචකය</u>** | | | |
| **උපදෙස්දීම, ව්‍යාපෘති අධීක්ෂණය, නියාමනය හා ඇගයීම** | 6,033,168 | 2,029,486 | 8,203,421 |
| | ---------------- | ------------- | --------------- |
| | **<u>150,075,990</u>** | **<u>142,151,938</u>** | **<u>317,069,171</u>** |

4.2 **අග්‍රිම අරමුදල් ගිණුම**

**-----------------------**

**මූල්‍ය ප්‍රකාශන හා ලබාගත හැකිවූ තොරතුරු අනුව 2013 වර්ෂය තුළ අග්‍රිම අරමුදල් ගිණුමේ මෙහෙයුම් හා එදිනට ගිණුමේ පැවති ශේෂය පහත දැක්වේ.**

| | **එජඩො** | **රු.** |
|---|---|---|
| **2013 ජනවාරි 01 දිනට ශේෂය** | 768,531 | 97,727,032 |
| **එකතු කළා : ඌනපූරණයන්** | 1,164,835 | 150,182,960 |
| **ප්‍රත්‍යාගණන වාසිය** | - | 2,569,613 |
| | ------------ | -------------- |
| | 1,933,366 | 150,479,605 |
| **අඩුකළා : ආපසු ගැනීම්** | 1,929,670 | 149,996,307 |
| | ----------- | ------------ |
| 2013 දෙසැම්බර් 31 දිනට ශේෂය | **<u>3,696</u>** | **<u>483,298</u>** |

## 5. විගණන නිරීක්ෂණ

**---------------------**

### 5.1 ගිණුම්කරණ අඩුපාඩු

**----------------------**

ව්‍යාපෘතිය විසින් මිලදී ගන්නා ලද රු.46,825,143 ක් පිරිවැය වූ ස්ථාවර වත්කම්වල භෞතික පැවැත්ම පරීක්ෂා කිරීමට හැකිවන පරිදි 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාරව ස්ථාවර වත්කම් ලේඛනයක් හා 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාරව පරිගණක, උපාංග හා මෘදුකාංග සඳහා ස්ථාවර වත්කම් ලේඛනයක් ව්‍යාපෘතිය විසින් පවත්වා නොතිබුණි.

## 5.2 විගණනය සඳහා සාක්ෂි නොවීම

---

සැපයු ආහාරවල ප්‍රමාණය, අතිරේක ආහාර බෙදාහැරීම් පිළිබඳ විස්තර, එක් එක් කාණ්ඩය සඳහා ක්ෂුද්‍ර ජීව රසායනික පරික්ෂණ සඳහා දෙන ලද නියැදි විස්තර හා ඒ මත ඉදිරිපත් කරන ලද වාර්තා සහ ප්‍රතිලාභීන් ලැයිස්තුව ආදිය විගණන පරික්ෂණය සඳහා ඉදිරිපත් කර නොතිබුණි.

## 6. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

---

## 6.1 අරමුදල් උපයෝජනය

---

අරමුදල් මූල්‍යයනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ගත ප්‍රතිපාදනය හා සමාලෝචිත වර්ෂය තුළ අරමුදල් උපයෝජනය හා සමුච්චිත අයවැයගත ප්‍රතිපාදනය සහ 2013 දෙසැම්බර් 31 දිනට තථ්‍ය අරමුදල් උපයෝජනය පිළිබඳ වැදගත් සංඛ්‍යා ලේඛන සමහරක් පහත දැක්වේ.

| ප්‍රභවයන් | ප්‍රදාන ගිවිසුම් යටතේ එකඟ වූ මුදල | | 2013 වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදනය | 2013 වර්ෂය තුළ උපයෝජනය කළ අරමුදල් | 2013 දෙසැ. 31 දක්වා සමුච්චිත අයවැයගත ප්‍රතිපාදනය | 2013 දෙසැම්බර් 31 දක්වා උපයෝජනය කළ අරමුදල් | |
|---|---|---|---|---|---|---|---|
| | එජඩො මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන. | එජඩො මිලියන | රු.මිලියන |
| <u>විදේශ ප්‍රදාන</u> | | | | | | | |
| ජපන් සමාජ සංවර්ධන අරමුදල | 2,731,700 | 300.48 | 150 | 150.07 | 272 | 2,882,447 | 317.06 |

පහත නිරික්ෂණයන් කරනු ලැබේ.

(අ) ව්‍යාපෘතිය සඳහා ප්‍රතිපාදනය කරන ලද රු.මිලියන 300.48 කට සමාන එ.ජ.ඩො 2,731,700 කින් ව්‍යාපෘති කටයුතු ක්‍රියාත්මක කිරීමෙන් පසු රු.මිලියන 317.06 කට

සමාන එජඩො 2,882,447 ක ප්‍රදාන වර්ෂ 03 කට වැඩි කාලයක් උපයෝජනය කර තිබූ බව නිරික්ෂණය විය.

(ආ) 2013 වර්ෂය සඳහා ශ්‍රී ලංකා රජයේ වාර්ෂික ඇස්තමේන්තුවල ශීර්ෂ 315 - උතුරු පළාත් සභාව - වැඩ සටහන 02 - සංවර්ධන කටයුතු, ව්‍යාපෘති 02 - පළාත් සංවර්ධනය යටතේ සලසන ලද ප්‍රතිපාදනය හා 2011, 2012 හා 2013 වර්ෂ තුළ දරන ලද තථ්‍ය වියදම පහත දැක්වේ.

| **වර්ෂය** | **ප්‍රභවය** | **ප්‍රතිපාදනය** | **වියදම** | **ප්‍රතිශතය** |
|---|---|---|---|---|
| -------- | -------- | ------------ | -------- | ------------ |
| | | රු. | රු. | |
| 2011 | විදේශ ප්‍රදාන | - | 151,158,757 | - |
| 2012 | විදේශ ප්‍රදාන | 122,493,000 | 142,151,938 | 116% |
| 2013 | විදේශ ප්‍රදාන | 150,000,000 | 150,075,990 | 100.05% |
| | | --------------- | ---------------- | |
| | | **272,493,000** | **443,386,685** | |

තථ්‍ය වියදම, ප්‍රතිපාදනය ඉක්මවා තිබුණු අතර ඒ සඳහා හේතු විගණනයට පැහැදිලි කර නොතිබුණි.

(ඇ) ප්‍රදාන ගිවිසුමට අනුව, සංරචක 4 ක් සඳහා මුළු ප්‍රදාන රු.මිලියන 300.48 ක් වෙන්කර තිබූ අතර ඉන් රු.මිලියන 317.06 ක මුදලක් 2013 දෙසැම්බර් 31 දිනට දරා තිබුණි. ඒ අනුව වෙන් කරන ලද ප්‍රදාන ඉක්මවා රු.මිලියන 16.58 ක මුදලක් උපයෝජනය කර තිබුණි. විස්තර පහත දැක්වේ.

| | **සංරචකය** | **ප්‍රතිපාදනය කරන ලද ප්‍රදාන මුදල** | **2013 දෙසැම්බර් 31 දිනට වියදම** | **වැඩි/අඩු වියදම (ශ්‍රීලංරු වලින්)** |
|---|---|---|---|---|
| | ------------------- | ---------------- | ---------------- | --------------- |
| (1) | අතිරේක ආහාර සලාක සැපයීම | 193,748,390 | 234,402,526 | 40,654,136 |
| (2) | ධාරිතා වර්ධනය හා ප්‍රජා | 45,897,170 | 37,765,260 | (8,131,909) |

| | | | | |
|---|---|---|---|---|
| | සවලීකරණය | | | |
| (3) | ප්‍රජා මූල පෝෂණ මැදිහත්වීම් | 39,496,710 | 36,697,964 | (2,798,746) |
| (4) | උපදෙස්දීම, ව්‍යාපෘති අධීක්ෂණය නියාමනය හා ඇගයීම් | 21,344,730 | 8,203,420 | (13,141,309) |
| | | **300,487,000** | **317,069,171** | **16,582,171** |

## 6.2 භෞතික කාර්ය සාධනය

පහත නිරික්ෂණයන් කරනු ලැබේ.

(අ) ඉලක්කගත ගර්භණී හා කිරිදෙන මවුවරුන් සහ වයස අවුරුදු 5 ට අඩු ළමුන් සඳහා ආහාර ( ජීවපෝෂ ) සැපයීම ව්‍යාපෘතියේ ප්‍රධාන කාර්යය විය. ඒ පිළිබඳ භෞතික ප්‍රගතිය පහත දැක්වේ.

| **වර්ගය** | **අතිරේක ආහාර ලබාදීම සඳහා ඉලක්කගත ප්‍රතිලාභීන් සංඛ්‍යාව** | **අතිරේක ආහාර සැපයූ තථ්‍ය ප්‍රතිලාභීන් සංඛ්‍යාව** | **ප්‍රතිශතය** |
|---|---|---|---|
| ගර්භණී කාන්තාවන් | 9,000 | 6,084 | 67 |
| කිරිදෙන මවුවරුන් | 5,000 | 5,404 | 108 |
| ළදරුවන් | 1,000 | 5,168 | 516 |
| ළමුන් | 11,000 | 11,478 | 104 |
| | 26,000 | 28,134 | |

කෙසේ වුවද අවුරුදු 2 සිට 5 දක්වා වූ ළමුන් සඳහා ආහාර සපයා නොතිබූ බැවින් එම වයස් කාණ්ඩයේ මන්දපෝෂණ අනුපාතය ව්‍යාපෘති අරමුණු යටතේ අපේක්ෂිත පරිදි අඩුකර ගෙන නොතිබුණි.

(ආ) ආහාර සැපයීම පුද්ගලික සමාගමක් මඟින් සිදුකර තිබූ බැවින් ලෝක බැංකු දූත කණ්ඩායම විසින් නිර්දේශ කරන ලද පරිදි ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ක්ෂේත්‍ර නිලධාරින්ගේ සහභාගිත්වය ඵලදායී නොවීය.

(ඇ) ජීවපෝෂ නියැදි රසායනාගාර පරීක්ෂණ ප්‍රමාදවීම් විගණනයේදී නිරීක්ෂණය විය. එබැවින් නියැදි පරීක්ෂා කිරීමෙන් තොරව එම විෂයයන් බෙදා හැර තිබුණි. ගබඩාවල තිබූ තොගය කල් ඉකුත් වීමට ආසන්නව තිබූ බැවින් අවස්ථා කිහිපයකදී එසේ කටයුතු කළ බව මේ සම්බන්ධයෙන් ලේකම්වරයා දන්වා තිබුණි. තවද ඒ පිළිබඳ අධීක්ෂණය හා නියාමන ක්‍රියාවලිය සම්බන්ධයෙන් සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන්ට පැමිණිලි ලැබී නොතිබුණි. තවද, ජීවපෝෂ තොග පිළිබඳ කල් ඉකුත්වීම් අවස්ථා කිහිපයකදී නිරීක්ෂණය විය. කාර්මික තාක්ෂණ ආයතනයේ හා වෛද්‍ය පර්යේෂණ ආයතනයේ වාර්තාවට අනුව සමහර නියැදි ක්ෂුද්‍රජීව පරීක්ෂණවලින් අසමත් වී තිබුණි. එබැවින් බෙදාහැරීමට පෙර ආහාර වල ගුණාත්මක තත්ත්වය තහවුරු කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) යාපනය දිස්ත්‍රික්කයේ අතිරේක ආහාර සැපයීම සම්බන්ධයෙන් ප්‍රජා සහභාගීත්වය පිළිබඳ විස්තර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ඉ) 2013 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘති කාල පරිච්ඡේදයෙන් සියයට 60ක් ඉකුත් වී තිබුණද, ආහාර වල අඩංගු ද්‍රව්‍ය පිළිබඳ පුහුණුව, ප්‍රජා සහාය ලබා ගැනීම, දිස්ත්‍රික් හා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී මට්ටමින් සංවේදීකරණ රැස්වීම්, රෝහලේ කාර්ය මණ්ඩලය පුහුණුව හා සන්නිවේදන විශේෂඥ සංවර්ධනය ආදිය ඇතුළත් එජඩො 188,245 ක ප්‍රතිපාදනයක් සහිත ව්‍යාපෘතියේ කාර්යයන් නවයක් ආරම්භ කර නොතිබුණි. අමු ආහාර ද්‍රව්‍ය වෙනුවට මිශ්‍රණයක් ලෙස ආහාර සැපයීම කර තිබූ බැවින් පුහුණුවක් ලබාදීම අවශ්‍ය නොවන බවත්, විශේෂඥවරුන් ලබාගත නොහැකි වීම හේතුකොටගෙන සන්නිවේදන විශේෂඥ හා පෝෂණ උපදේශක සංවර්ධනය කිරීමද කළ නොහැකි වූ බවත් මේ සම්බන්ධයෙන් ලේකම්වරයා දන්වා තිබුණි

## 6.3 වත්කම් කළමනාකරණය

----------------------------

2012 වර්ෂය තුළදී රු.6,645,532 ක පිරිවැයකට ප්‍රසම්පාදනය කරන ලද වැඩිහිටි හා ළමුන්ගේ උස හා බර මැනීමේ උපකරණ 180 ක්, එම උපකරණ භාවිතා කිරීම සඳහා විධිමත් උපදෙස්

නොමැති වීම හා එම උපකරණ ක්‍රියාත්මක කිරීම සඳහා කාර්යාල කාර්ය මණ්ඩලයට හුරුවක් නොමැති වීම වැනි කරුණු හේතුවෙන් සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී අංශයන් විසින් 2013 දෙසැම්බර් 31 වන විටත් සම්පූර්ණයෙන් උපයෝජනය කර නොතිබුණි.

**7. පද්ධති හා පාලන**

**------------------**

පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

(අ) ගිණුම්කරණය

(ආ) ප්‍රසම්පාදනය